කොළඹ විශ්වවිද්‍යාලය
සිංහල අධ්‍යයනාංශය
ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - 2018

# SLG 3242 - භාෂාව, සමාජය හා බලය

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.

---

1. ' භාෂාව සමාජීය සංසිද්ධියකි.' භාෂාව හා සමාජ ජීවිතය අතර සම්බන්ධය ඇසුරින් මේ අදහස පැහැදිලි කරන්න.

2. භාෂාවේ දේශපාලනික මානයන් අධ්‍යයනය කළ යුත්තේ ඇයි? සිංහල භාෂාව හා සමාජය ඇසුරින් සාකච්ඡා කරන්න.

3. " සමාජ පන්ති අතර ඇති වෙනස්කම් එම සමාජ පන්තිය නියෝජනය කරන භාෂා ව්‍යවහාරයේ දක්නට ලැබේ." මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව විමසන්න.

4. " භාෂාවේ ඇති බලය අභිමත අරමුණු සඳහා යොදා ගැනීමට ජනමාධ්‍යවේදියා භාෂාව භාවිත කරයි." සාකච්ඡා කරන්න.

5. "යම් සමාජයක ස්ත්‍රී - පුරුෂ සමාජභාවී ආකල්ප එම සමාජයේ භාෂා භාවිතයෙන් පිළිබිඹු වේ". තෝරා ගත් භාෂාවක් ඇසුරින් විමසන්න.

6. "යටත්විජිත පාලනය සඳහා භාෂාව වැදගත් සාධකයක් විය". ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගය ඇසුරින් පැහැදිලි කරන්න.

7. එක්කෝ
   'භාෂාත්මක ජාතිකවාදය' යනු කුමක්දැයි පැහැදිලි කොට ස්වභාෂා ව්‍යාපාරය තුළ සිංහල භාෂානුරාගයේ නැගීම සාකච්ඡා කරන්න.
   නැතහොත්
   ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා ප්‍රශ්නය දේශපාලනීකරණය වූ ආකාරය පිළිබඳ විවරණයක් කරන්න.

( අ. පි. බ)

8. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> (3) පිළිබඳව සටහන් ලියන්න.

(අ ) සංකථන විශ්ලේෂණය ( Discourse Analysis)

(ආ) සැපීර් - වෝෆ් උපන්‍යාසය

(ඇ) සම්මත භාෂාව ( Standard Language

(ඈ) භාෂා සැලසුම්කරණය ( Language Planning)

(ඉ) හෙළ හවුල